යුද්ධය අවසන් වී ඇත. අප උතුරට ගොස් මේ සියල්ල නැරඹුවේද යුද්ධය අවසන් වු නිසාය. යාපනයක් ගැන සිහිනෙන්වත් නොසිතු අප දු දරුවන් සමඟ උතුරට යාමට ලැබුණු අවකාශය ලබාදුන්නේ ජීවිතය පරදුවට තබා සටන් කළ සෙබලුන්ය. එහෙත් මේ සියල්ල දකින විට සිතට මැවෙන්නේ එක් දෙයකි. මෙතෙක් කල් අප සටන් කළේ කා සමඟ ද ? .... අප සටන් කළේ අපි සමඟිනි. මියගිය සියල්ල අපේම මිනිසුන්ය. එහෙත් ඔවුන් අතරත් අප අතරත් ඇති සැබෑම වෛරස් නිර්මාපකයා කවුරුද ? ඒ ඔවුන් හා අප පාලනය කළ අතීත හා වර්තමාන මිනිසුන්ය.

වරෙක එම මිනිසාම ද්‍රෝහියෙකු වෙයි. වරෙක වීරයෙකු වෙයි. උපදින වීරයන්ගේ සොහොන් කොත්මත ජයපැන් බොන පාලකයන් ගේ නම් ගම් ඉතිහාසගත වී ගල් පුවරු මත සනිටුහන් වන්නේ අතීතයට සිනාසෙමිනි.

යුද්ධයේ ගිනි පුපුරු මේ පොළොව මත තවමත් ඇත. වසර තුනක් තිස්සේ ජයපැන් බොන අපි මෙයට ලබාදෙන ස්ථිරසාර විසඳුම කුමක්දැයි තවමත් තීරණය කර නැත. එය මෙම රජයට ලබාදීමට නොහැකි නම් ලබාදෙන්නට හැකි රජයක් බිහිවන්නේද නැත. එහෙත් එම විසඳුම් දීමට පෙර ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමද රජයේම වගකීමකි. දෙමළ දේශපාලකයන් ඉල්ලන දෑ එම දුප්පත් ජනතාව දන්නේ නැත. ඔවුනට දැනගන්නට වුවමනාවක් ද නැත. එනිසා රජය මුලින්ම දරිද්‍රතාවයට පීඩනයට පත් වී ඇති එම ජනතාව ජයගත යුතුය. ඊට පසු ලැබිය යුතු බලතල එම ජනතාවම තීරණය කරනු ඇත. යුද්ධයෙන් ජයග්‍රහණය කළ පාලකයෙකුට වඩා දරිද්‍රතාවය ජයග්‍රහණය කළ පාලකයෙකුට ජනතාව වඩාත් ආදරය කරනු ඇත.

නිමි.





